## දහසක් මල්

# ලෝ පූජිත දක්ෂයෙක්

මෑතක් වෙනතුරු හැම කෙනෙක්ම හිතාගෙන හිටියෙ 'ලියනාඩෝ ඩාවින්චි' කියන්නේ දක්ෂ චිත්‍ර ශිල්පියෙක් විතරයි කියල. කොහොම වුනත් ඔහු ඇත්තටම මෙතෙක් ලෝකයේ බිහිවූ චිත්‍ර ශිල්පින් අතරෙන් දක්ෂතම චිත්‍ර ශිල්පියෙන් කියන එක ගැන නම් කිසිම විවාදයක් නැහැ. දනට ලෝකයේ තියෙන වටිනාම චිත්‍ර දෙකක් වන 'මොනාලිසා' හා 'අන්තිම භෝජනය' යන ලෝක ප්‍රසිද්ධ චිත්‍ර දෙකම නිමවෙලා තියෙන්නේ ලියනාඩෝ ඩාවින්චිගෙ විශ්ව කර්ම දෑත් වලිනුයි. ඒත් මෑතකදී ඉඳල ඔහුගේ හිතේ ඇඳුන දේවල් ගැන සටහන් කරපු පිටු 5700 කින් යුත් පොතක් හමුවුනාට පස්සෙයි ඔහු දක්ෂ චිත්‍ර ශිල්පියෙක් පමණක් නොව දක්ෂ විද්‍යාඥයෙක් බවත් මුලු ලෝකෙම දන ගත්තේ.

ඔහු ඉස්සෙල්ලාම සේවය කළ 'ලුඩ්පිස්කෝ ස්පෝර්සා' කියන සිටුවරයාගේ හිතත් දිනා ගත්තේ මේ වගේම විශ්ව කර්ම වැඩක් කරලා. ඉතාලියෙ ෆ්ලොරොන්ස් නුවර හිටිය 'අන්ද්‍රෙ දෙල් වොරොන්කියො යටතෙ ශිල්ප ඉගෙන ගෙන හමාර වෙන කොට ඔහුට අවුරුදු 20 ක් ඉරෙ උනා විතරයි. ඊට පස්සේ ඔහු අස්ස හිසක් විදිහට වීනාවක් හදල එහි හඩ මාරු කරන්නට අස්ව දතක් යොදල ඒක විලානය පාලනය කරපු ලුඩ්විකා සිටු වරයාට ප්‍රදනය කරාට පසුව ඒ ගැන පැහැදුනා සිටුවරයා කිසිම කථාවක් නොකට ලියනඩෝව තමාගේ සේවයට බඳවා ගනු ලැබූහ.

ලියනාඩො උපත ලැබුවේ 1452 ෆ්ලොරන්ස් රජයට අයිති වින්සි කියන ජනපදයේ. ඔහු හැදුනේ ඔහුගේ සීයයි ආච්චියි ලඟ. ඔහුගේ පියා ගමේ නිලධාරියෙක් හැටියට සේවය කරපු අතර මව සේවය කලේ තානාපති සේවයේ මෙහෙකාරියක් හැටියට.

අනිත් ලෝක ප්‍රසිද්ධ වුන හැම කෙනෙක්ම වාගේ 'කුඩා ලියනාඩෝත්' පුංචි කාලෙ සිටම නොයෙකුත් දේවල් ඇඳීම අතින් තමන්ගේ දක්ෂකම් පෙන්වන්න පටන් ගත්හ. ඒ විතරක් නෙමෙයි අමාරු ගණිත ගැටලු වුනත් විසඳන්න ඔහුට ගත වුනේ ඉතාම සුලු වේලාවක්. මේ හින්දම තමා ඒ කාලෙ ඉතාලියෙ ප්‍රසිද්ධම ශිල්පියා වුන 'අන්ද්‍රෝ දෙල්වරෝකියෝ' යටතට ශිල්ප ඉගෙන ගන්න ඔහුව පිටත් කලේ. ප්‍රංස ලියනාඩොගෙ දක්ෂ කම් වලින් පැහැදුනු වෙරොකියෝ ඔහුට ලියෙන් හා කිරිගරුඬ වලින් රූප අඹනනන් චිත අඳින්නන් පමණක් නොව ග්‍රීක, ලතින් හා ගණිතය යනාදී හැම අංශයක්ම ගැකම ඔහුට පුහුණුවක් ලබා දුන්නා.

ඔහු ඇත්තටම ලෝකයට දුන්නේ උසස් චිත්‍ර විතරක් නෙමේ. ඔහු තම සිතට නැගුණු නොයෙකුත් අදහස් ලියා ඇති කටු සටගන් පොත් වලින් ලෝකයට අවශ්‍ය කරන නවීන යන්ත්‍රෝපකරන වල රූ සටහන්ද සටහන් කර තිබුනා. එහෙත් මෙම සටහන් ඔහු ලියා තැබුවේ අත් අකුරු නොපිටට සිටන විදිහට එයට හේතුව වුනේ ඒ සටහන් ලියන කාලෙ වාසය කරපු අය ඒ සටහන් ගැන වැරදි නිගමනවලට බසියි කියන බිය නිසා. ඒත් ඇත්තටම එම සටහන් බලන විට ඔහු කල පර්යේෂණ වල ප්‍රතිඵල ලියා තිබුනේ වත්මන් වෙසෙන දක්ෂ විද්‍යාඥයෙක් හැටියට. ඔහු එයින් අදහස් කළ දේවලට එකල විසූවන්ගෙන් කිසිම සහයෝගයක් ලැබුනේ නැත්තේ ලියනාඩෝ එයින් අදහස් කල දේවල් බොහොමයක් සොයා ගැනීමේ ඥනය ලබාගැනීමට ඔහු ජීවත් වුන කාලයට වැඩියෙන් සියවස් ගණනාවක් ලෝකයට ගතවෙන හින්දයි.

(39 පිටුවට)

# ලෝක පූජිත . . . . .

(34 වෙනි පිටුවෙන්)

ඔහු මුලින්ම ඉදිරිපත් කලේ වසංගත වලින් නිතර පෙළුන නගර සුද්ධ පවිත්‍ර කිරීම සඳහා යොදගත හැකි කසල ශෝධක ක්‍රමයක් ඒ වාගේම ඔහුට මිනිස් සිරුර ගැනද තිබුනේ පුදුම නිවැරැදි දැනීමක්. වෛද්‍යවරු මළමිනී කපන විට ඔහු අභ්‍යන්තර කොටස් ඉතාමත් නිවැරදිව තමාගෙ සටහන් පොතේ ඇඳ තිබුනා. මේ විතරක් නොමේ මිනිසාගෙ හිස් කබල හකු ආදී අංගෝ-පාය සටහන් කර තිබූ අන්දමත් දරු ගැබක් දක්වා ඇති අන්දමත් විද්‍යානුකූලව ඉතාමත් නිවැරදි බව මෙකල වෙයෙන විද්‍යාඥයින් පවා අවිවාදයෙන් පිළිගන්නවා. මේ ආකාරයට ඔහු වෛද්‍ය ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් වෙන ආකෘති කීපයක්ම නිම කරනු ලැබ තිබුනා.

මේ විතරක් නෙමේ ඔහු වැනිසියේ නිල-ධාරීන් සඳහා යුද උපකරන නිර්මාණය කිරීම කෙරෙහිත් හිත යොදවා තිබුනා. මේ උපකරණ අතර දියේ ගැඹුරට කිමිදිය හැකි උපකරණ කට්ටලයක්ද ඔහු නිපදවනු ලැබුවත් සිය සටහන් පොතේ ඇතුල් කලේ නැත්තේ මිනිසුන් එය දිය පත්ලේ මිනීමැරීම සඳහා යොද ගනු ඇතැයි සැකය නිසා. ඔහුගේ සටහන් අතර තිබී වර්තමානයේ පාවිච්චි කරන යුධ ටැංකියකට සමාන ආකෘතියක් සොයා ගත් පසු විද්‍යාඥයින් පුදුමයට පත්උනා. මෙයට අමතරව මැෂින් තුවක්කුව ගැන මුල්ම අදහස ඉදිරිපත් කරනු ලැබුවෙක් 'ලියානොඩොමයි' මොහු අදහස් කල මැෂින් තුවක්කුව එකවර කටයුතු තුනක් කරනු ලැබුවා. මෙයින් මාරුවෙන් මාරුවට වෙඩි තැබීමත්, මුනිස්සන් ඇතුලු කිරීමත් තුවක්කුව රත්වීම හා සිසිල් කිරීමත් එක විට කරනු ලැබුවා. ක්‍රි. ව. 1485 තරම් ඈත කාලෙක මේ වගේ අදහසක් ඉදිරිපත් කිරීම කොතරම් අසිරු කරුණක්ද කියල මොහොතකට සිතන්න.

"සියාර් බෝජියා'' නමින් ලියානාඩෝ සේවය කල "ලුඩවිකෝ ස්පොට්සා'' පරාජය කලාට පසු ලියානාඩෝට ඔහු විසින් යටතේ සේවය කරන්න සිදුවුනත් ඔහු තම හැකියාව විනාශ කරගත්තේ නැහැ. මෙම රජුගේ අදහස වුනේ මුළු ඉතාලියම තමන්ගේ යටතට ගන්න. කොහොම වුනත් ටස්කනි, ඇම්බ්‍රියා කියන ප්‍රදේශ දෙක සිතියමකට ගන්න 'ලියානෝඩෝට' ඔහු විසින් නියම කරනු ලැබුවා. මේ කාර්යය නිම කිරීම සඳහා ඔහු වර්තමානයේ නවීන මෝටර්රියක ඇති සැතපුම් මනින මීටරයකට සමාන උපකරණයක් ඔහු නිර්මානය කර තිබුනා. ඒත් ඔහුට නවීන යන්ත්‍ර නොතිබුන හින්ද මෙය සවි කරනු ලැබුවේ අත් කරත්තයකට. මෙම අත්කරත්තය තල්ලු කරගෙන යන විට මෙම මීටරයේ සැතපුම් ගණන් සටහන් වුනා. ඇත්තටම ලියනෝඩොගේ නිර්මානත් වර්තමාන නිර්මානත් අතර තියෙන එකම වෙනස ඔහු ලී වලින් ඒවා නිම කිරීමෙත් අද යකඩ වලින් ඒවා නිර්මාණය කිරීමත් යන වෙනස පමණයි.

රියක් එසවීම සඳහා යොදගනු ලැබෙන 'ජැක්' එකත් නූතන වාහන වල ගියර් මාරු කිරීම සඳහා යොදගනු ලබන ආකෘතියත්, යන්ත්‍රවල දක්නට ලැබෙන බෙයාරිං යන දේව-ලුත් ඔහුගේ නිර්මාණ අතර වුනා. මීටත් වඩා පුදුමය නම් මොටෝරියක ඇති 'ඩිපරෙන්ෂලය' වංගුවක් ගන්නා විට එක රෝදයක් අනෙකට වඩා ඉක්මණින් කැරකිය යුතු යන නියමයත් ලියනාඩෝ විසින්ම සොයාගෙන තිබීමයි.

ඔහුගේ සටහන් අතර කුඹගස් දෙකක් ඇති නැවෙක නිර්මානයක් දක්නට ලැබුනා. මෙය සාදනු ලැබුවේ යුද්ධයකදී එක කුඹ ගහක් වෙඩි පහරකින් විනාශ වුවහොත් අනෙක් කුඹගසේ උදව් ඇතිව යාත්‍රා කිරීම සඳහායි. සුලගේ වේගය මැනීමට ලියනාඩෝ සෙයා ගනු ලැබූ සුළං මානනයද ලෝකයේ මේ ආකාරයේ මුල්ම යන්ත්‍රය බව අද බොහෝ අය විශ්වාස කරනු ලබනව.

පිස්ටන් වලින් වැඩ කරන වතුර පොම්ප සෑදීමේ ක්‍රමය මුලින්ම හෙලිකරනු ලැබුයේත් ලියනෝඩෝ විසින් මේ සඳහා බලය ලබා ගැනීමට ශහු යොදගනු ලැබුවේ ගලා යන ජලයයි. මේ ආකාරයට ඔහු තැනූ වතුර පොම්පය අඩි 70 ක් පමණ උසකින් යුක්ත බව විශ්වාස කරනු ලබන අතර දිය මත පිහිනීමේ නියමය මත නැවකට අවහිරයක් නැතිව යාත්‍රා කිරීම පිළිබඳ වද ඔහු උපදෙස් දුන් බව විශ්වාස කරනව.